ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

81 වර්ෂය - ශ්‍රී බු: ව 2570 2026 සැප්තැම්බර් 26 බිනර කළාපය

ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,
ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,
දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක
සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,
කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"සසර පුරුදු"

"නත්ථි රාගසමෝ අග්ගී - නත්ථි දෝසසමෝ ගහෝ
නත්ථි මෝහසමං ජාලං - නත්ථි තණ්හාසමා නදී"

(ධම්ම පදය, මල වග්ග)

රාගය සමාන ගින්නක් නැත. ද්වේශය සමාන දැඩි අල්ලාගැනීමක් නැත. මෝහය සමාන දැලක් නැත. තණ්හාව සමාන නදියක් (ගඟක්) නැත.

බුදුහාමුදුරුවො ජේතවනාරාමෙ වැඩ වසද්දී උපාසක වරුන් පස් දෙනෙක් බණ අහන්න පන්සලට ආවා. බුදුහාමුදුරුවෝ ඒ පස් දෙනාට බණ කියන්න පටන් ගත්තා. එක්කෙනෙක් වාඩිවෙලා හිටපු තැනම නිදාගත්තා. තව කෙනෙක් ළඟ තිබුණු ගහක් අල්ලාගෙන සොලවමින් හිටියා. තව කෙනෙක් ඇඟිල්ලෙන් බිම ඉරි ඇන්දා. හතර වෙනියා අහස දිහා බලාගෙන හිටියා. පස්වෙනියා විතරයි හරිහැටි බණ ඇහුවෙ. ඉතිරි හතර දෙනාටම බුදුහාමුදුරුවො දේශනා කරන ධර්මය ගැන අවධානයක් තිබුණේ නැහැ.බලන්න පින්වතුනි, අවාසනාවක තරම! බුදුහාමුදුරුවො වැඩ ඉන්න කාලෙක ඉපදිලා, බුදුහාමුදුරුවො අවුරුදු විසිපහක් වැඩ සිටිය

සැවැත්නුවර ජීවත්වෙන්න ලැබිලා. බුදුහාමුදුරුවන්ගේ ශ්‍රී මුඛයෙන්ම බණක් අහන්නත් අවස්ථාව ලැබිලා තියෙද්දිත් ඒ බණට සිත යොමුකර ගන්න ඒ හතර දෙනාට බැරි වුණානේ. අදත් පන්සලට බණ අහන්න එන අය අතරේ මේ වගේ උදවිය ඕනෑ තරම් ඉන්නවා.

හොඳින් බණ අහපු කෙනා සෝවාන් වුණා. ඉතිරි හතර දෙනා හිස් අතින්ම ගෙදර ගියා. මේ කාරණය දැකපු ආනන්ද හාමුදුරුවො ඒ ගැන බුදුහාමුදුරුවන්ගෙන් විමසුවා. අතීත භවයන්හි පුරුදු නිසා එහෙම වුණු බව බුදුහාමුදුරුවො පැහැදිලි කළා.

පළමු වැනියා ආත්මභාව 500ක් දරණ වැල උඩ හිස තියාගෙන නිදාගනිපු පුරුද්ද නිසා බණ අහද්දීත් නින්ද ගියා. දෙවැන්නා ආත්මභාව 500 ක් වඳුරු යෝනියේ ඉපදිලා හිටපු නිසා මේ ජීවිතයේදීත් ගස් අතු හොලවන්න පටන්ගත්තා. වඳුරන්ට එක මොහොතක් වත් සංවරව ඉන්න බැහැ. අතපය සොලවනවා. වටපිට බලනවා. ඇඟ කසනවා. ඒ පුරුද්ද නිසා මිනිසකුව ඉපදී සිටියත් නොසන්සුන් වුණා. තුන්වැනියා ආත්මභාව 500ක් පොළොව හාරන ගැඩවිලුන්, පණුවන්, වෙලා ඉඳලා මේ ජීවිතයෙදීත් පොළොව හාරන්න පටන් ගත්තා. හතරවැන්නා ආත්මභාව 500 ක් නැකැත් බලන කෙනෙකු වෙලා ඉපදිලා හිටියා. ඒ පුරුද්දට බණ අහන වෙලාවෙදීත් අහස බලාගෙන හිටියා. පස්වැනියා ආත්මභාව 500ක් බමුණු කුලයේ ඉපදිලා වේද මන්ත්‍ර හදාරලා, ශිෂ්‍යයන්ට උගන්වලා පළපුරුද්ද තිබුණ නිසා බණට හොඳින් අවධානය යොමු කළා.

පුද්ගලයාගේ ජීවිතයේ යම් යම් ගති ලක්ෂණ හුරුපුරුදු, දක්ෂතාවන් සඳහා සසර පුරුදු බලපාන බව මෙයින් පෙනෙනවා.බටහිර මනෝවිද්‍යාඥයන් කියන විදියට මිනිසාගේ දෛනික වර්යාවන්ගෙන් 40% කට වඩා පෙර පුරුදු මත සිදුවෙනවා. බුදුදහමේදී පෙර පුරුදු හඳුන්වන්නේ "වාසනා ගුණ" කියල. ඒවා පුද්ගලයාගේ සිතේ අනුසය වශයෙන් සැඟවිලා පවතිනවා. බාහිර අරමුණක් මගින් පෙළඹවීමක් ඇතිවුණාම අර සසර පුරුද්ද මතුවෙනවා. සුවඳ ද්‍රව්‍ය පිරවූ භාජනයක් එම සුවඳ ද්‍රව්‍ය ඉවත් කළ පසුවත් එම සුවඳම රැඳී තියෙනවා වගේ සත්ත්වයාගේ සිතේ වාසනා ගුණ රැඳී පවතිනවා.

රහත් වුණත් වාසනා ගුණ ඉතිරි වෙනවා. පිළින්දවච්ඡ හාමුදුරුවො රහත් වී සිටියත් අනෙක් අයට 'වසලයා' කියල කථා කළේ පෙර භවයන්හි බ්‍රාහ්මණ කුලයේ ඉපදිලා ඒ විදියට කථා කළ පුරුද්ද නිසයි. බටහිර මනෝවිද්‍යාවට අනුව පුරුදු ඇතිවන්නේ මේ ජීවිතයේදී පමණයි. බුදුදහමට අනුව ඒවා සසරේ දිගු කලක් තිස්සේ සත්ත්වයාගේ සිතේ පැවතගෙන එනවා. වාසනා ගුණ නැත්තේ බුදුහාමුදුරුවන්ට පමණයි.

කෙලෙස් සහ වාසනා ගුණ අතර වෙනසක් තියෙනවා. රහත් වෙනකොට සියලුම කෙලෙස් ප්‍රහීන වුණත් වාසනා ගුණ ප්‍රහීන වෙන්නේ නැහැ. කර්ම සහ වාසනා ගුණ අතරත් වෙනසක් තියෙනවා. කර්ම කියන්නේ සිතා මතා තිදොරින් කරන ක්‍රියාවලදී ඇතිවන චිත්ත ශක්තියට. ඒවාට විපාක ලැබෙනවා. වාසනා ගුණ වලින් විපාක දීමක් සිදුවෙන්නේ නැහැ. එහෙත් පින් හෝ පව් කිරීමට වාසනා ගුණ මගින් පෙළඹවීමක් සිදුවෙන්න පුළුවන්. දේවදත්ත ආත්මභාව ගණනාවක් බෝසතුන්ට වෛර බැන්දා. මේ ජීවිතයේදීත් බුදුහාමුදුරුවන් මරන්න දුනුවායන් යෙදුවා. ගල් පෙරළුවා.

බුදුරජාණන් වහන්සේටම පමණක් ඇති ඤාණ හයෙන් එකක් වන ආසයානුසය ඤාණයෙන් සත්ත්වයන් තුළ ඇති මේ නැඹුරුතාවන් හඳුනාගෙන තමයි උන්වහන්සේ දහම් දෙසන්නේ. පුද්ගලයාට ගැලපෙන කමටහන් ලබාදෙන්නේ. එවිට ඉක්මනින් ප්‍රතිඵල ලැබෙනවා. රහතන් වහන්සේට එම හැකියාව නැහැ. එක ගාථාවක් හාරමාසයක් තිස්සේ පාඩම් කළත් පාඩම් කරගන්න බැරිවුණු චුල්පන්ථක හාමුදුරුවො බුදුහාමුදුරුවන් ලබා දුන් කමටහන වඩා රහත් වුණා. සැරියුත් හාමුදුරුවො තමන් ළඟ පැවිදි වුණු ස්වර්ණකාර පුත්‍ර හාමුදුරුවන් රාග චරිතය ඇති කෙනෙක්ය කියා හිතල දුන්න අසුභ භාවනාවෙන් ඒ තරුණ හාමුදුරුවන්ට සිතේ දියුණුවක් ලබාගන්න බැරි වුණා. බුදුහාමුදුරුවො දුන්න කමටහන වඩා රහත් වෙන්න හැකි වුණා. ස්වර්ණකාර හාමුදුරුවන්ට අසුභ අරමුණක් නොව සුභ අරමුණක් භාවනා කරන්න ලබා දිය යුතු බව බුදුහාමුදුරුවො දැනගත්තේ ආසයානුසය ඤාණයෙන් ඒ හාමුදුරුවන්ගේ පෙර භවවල පුරුදු දැකලා.

මේ ගාථාවේ රාගය ගින්නකට උපමා කර තියෙනවා. සාමාන්‍ය ගිනි ඇවිලෙන්නේ දර, තණකොළ ආදිය දැමීමෙන්. රාගය නමැති ගින්න ඇවිලෙන්නේ පඤ්චකාම වස්තු අරමුණු වෙන විටයි. සාමාන්‍ය ගින්න, වතුර දමල නිවන්න පුළුවන්. රාග ගින්න නිවන්න පුළුවන් වෙන්නේ ප්‍රඥාවෙන් එම සුභ අරමුණුවල ආස්වාදයත්, ආදීනවයත් දැකීමෙන් පමණයි. ඒ නිසයි රාගය සමාන ගින්නක් නැහැ කියල වදාළෙ.

ද්වේෂය උපමා කළේ දැඩි අල්ලා ගැනීමකට. කිඹුලෙකුට ගොදුරක් ලැබුණාම ඌ ඒක තදින් අල්ලාගෙන වතුර යටට ඇදගෙන යනවා. ඒ වගේ ද්වේෂය සිතේ ඇති වුණාම එයින් පුද්ගලයා සම්පූර්ණයෙන්ම යටත් කර ගන්නවා. හොඳ නරක වටහා ගන්න බැරි වෙනවා. ලෙහෙසියෙන් ගැලවෙන්න බැහැ. එයින් තමාටත් අනුන්ටත් විනාශය ළඟා කර දෙනවා. මෝහය උපමා කළේ දැලකට. දැලක පැටළුනාම ලෙහෙසියෙන් ගැලවෙන්න බැහැ. සත්ත්වයා මෝහ දැලේ පැටළුනාම සංසාරයෙන් ගැලවෙන්න නොදී හිර කර ගන්නවා. මෝහ දැල කපා දැමිය හැක්කේ විදර්ශනා ප්‍රඥාව නැමති තියුණු අසිපතෙන් පමණයි. මෝහය නිසා පුද්ගලයා හරිදේ වැරදි ලෙසත් වැරදි දේ හරි ලෙසත් වටහා ගන්නවා. තණ්හාව උපමා කළේ විශාල ගංගාවකට මිනිසාගේ සිතේ ඇතිවන අසීමිත ආශාවන් කවදාවත් අවසන් වෙන්නේ නැහැ. සාමාන්‍ය ගංගාවක් මුහුදට වැටිලා නතර වෙනවා. තණ්හාව එහෙම නෙවෙයි. තණ්හාව නැති කරන තුරු අනන්ත කාලයක් සත්ත්වයා සංසාරේ ඇදගෙන යනවා. පංච කාමයන් විඳලා අවසන් කරන්න කවදාවත් බැහැ. "කාමේසු ලෝකේ නහි අත්ථි තිත්ති" යනුවෙන් වෙනත් දේශනාවකදී බුදුහාමුදුරුවෝ වදාළේ කාම සම්පත් විඳ තෘප්තිමත් වෙන්න බැහැ කියල. එක ආශාවක් ඉටුවන විට තවත් ආශාවක් ඇති වෙනවා. ගංවතුර ඇතිවුණාම ඒ අවට තියෙන දේත් විනාශ කරගෙන යනවා. මිනිසා තුළ තණ්හාව ඇතිවුණාම ගුණධර්ම, යහපත් සිතුවිලි විනාශ වෙනවා.

සමාධිය ඇති කරගෙන ප්‍රඥාව අවදිකර ගැනීමට තියෙන ප්‍රධාන බාධාව තණ්හාවයි. මී පැණි බිඳුවක් වටා මී මැස්සෙකු කැරකෙනවා වගේ අපේ සිතත් පංචකාමය නමැති රස දේ සොයමින් දුවනවා. ඇතිවීමක් නැහැ.තණ්හාව නිසා අපේ සිත නීවරණ නැමති අඳුරෙන් වැසී යනවා. තණ්හාව සහ රාගය අතර වෙනස මොකක්ද? තණ්හාව කියන්නේ පරක් තෙරක් නොපෙනෙන මහා සාගරය වගේ විශාල ලෙස පැතිරිච්ච එකක්. කාම, භව, විභව යනුවෙන්

මෙය කොටස් තුනකට බෙදෙනවා. රාගය කියන්නේ රූප ශබ්ද ආදී පංච කාම වස්තූන් මගින් ඇස කන ආදී ඉඳුරන් පිණවීමට ඇති ආශාවයි. ඒකත් තණ්හාවෙම කොටසක්. පංචකාමයට ඇලීම රාගයයි. එය මත්වතුර බොන්නෙකුට නැවත නැවත ඒවා බීමට ඇතිවන පිපාසය වගෙයි. ඔහුට අවශ්‍ය වන්නේ ජලය නොව මත්වතුරයි. රාගය වතුර පිපාසය වගෙයි. වතුර තිබහ කෙනා සොයන්නේ ජලය මිස මත් වතුර නෙවෙයි. රාගය අසුභ භාවනාවෙන් දුරු කළ හැකියි. තණ්හාව දුරුකිරීමට මරණානුස්සතිය වැඩිම සුදුසුයි. ලෝභ දෝස ඇතිවීමට බලපාන මෝහය විදර්ශනා භාවනාවෙන් දුරු කරන්න පුළුවන්. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

ඔබ සැමට උතුම් වූ නිවන් සැප ලැබේවා !